රඟමඩලෙන් ඇහෙන තූර්ය



ශ්‍රීනාත් මද්දුමගේ

# කළුතර පාලම හැදුවෙත් අයියල ද?

නාට්‍ය බස් එක කියන්නෙ විනෝද සාගරයක්. කොළඹින් බස් එකට නගින අප සමහර විට දවස් හතරකින් පහකින් තමයි නැවතත් බොරැල්ලේ වයිඑම්බීඒ එක ළඟට හෝ සුදර්ශිය ළඟට එන්නෙ. සියළු නළු නිළියන් පිරිවරා සංගීත ශිල්පීන්ද විදුලි ආලෝක ශිල්පීන් ද වේදිකා කළමණාකරුවන් ද සංවිධායක ද නිළියන්ගේ ආරක්සාවට එන මව් පියන් ද සමගින් නාට්‍ය බසයේ ගමන අපට ගෙනදුන් නේ මහත් සතුටක්.

බසයේ එක පසෙක දේශපාලන සංවාදයකි. එහි මූලිකයා අජිත් මෙන්ඩිස් ශ්‍රියන්ත මෙන්ඩිස් හා ජැක්සන් ඇන්තනි ය. අනෙක් කෙළවරය වසන්ත විට්ටච්චි ප්‍රමුඛ පිරිස යාන් හෑලි කතාවක ය. තවත් තැනක රොඩ්නි වර්ණකුල ඇතුළු පිරිස සංගීත සාජ්ජයක ය. විදුලි ආලෝක ශිල්පි ගාමිණී ඇතුළු පිරිස කාඩ් කුට්ටමට යටවී සිටිති. මේ අතරේ හොර රහසේ පෙම් කරන්නෝද සිටිති.

මේ කියන කතාව සිදුවුණෝ 1990 දී පමණ " පැන්ස දෙකේ හංසයා" නාට්‍යයත් සමගින් නාට්‍ය බසයේ රට වටා යන අතරේ දී ය.

එදා දර්ශනය තිබුණෝ ගාල්ලේ පුරහලේ ය. අපි උදේ අටට පමණ බොරැල්ලෙන් පිටත් වී ගාල්ල බලා ගියෙමු. කොළඹ ගාලු පාරේ කවදාවත් නිම නොවන පාලම් වැඩ පොළත් තිබුණි. අවුරුදු ගණනාවක් තිස්සේ නිම නොවුණ බෙන්තොට පාලම ගාලු පාරේ ගිය ඔබ සැමටත් අමතක වන්නට විදියක් නැත. මේ පාලම තිබුණෝ සුප්‍රකට කන්දෙ විහාරයට හැරෙන හන්දියට ආසන්නව ය.

මේ පාලම හදන්නට අවුරුදු ගණනාවක් ගියත් මෙයට පසුව වැඩ පටන් ගත් කළුතර පාලම සාදා නිම වී තිබුණි. මේ වැඩ නිම නොවන පාලම නාට්‍ය බසයේ අපට ගෙනදුනේ විශාල හාස්‍යය කි. සැම දිනකම මේ පාලම් වැඩ පළ ළඟින් යනවිට ඔලුව බසයේ ජනේලයකින් එළියට දමා "අයියේ.. අයියේ.. කළුතර පාලම හැදුවෙත් අයියලද..?" පාලම් වැඩපළේ පිරිසෙන් කෑ ගසා ඇසීම අපේ සමහර නලුවන්ගේ පුරුද්දක් විය.

වැඩපොලේ මිනිසුන් ශුද්ධ සිංහලෙන් පිළිතුරු දෙන විට එය අපේ පිරසට මහත් විනෝදයක් විය.

මේ කියන දවසේත් අපි ගාල්ලට යමින් සිටියෙමු. බසය පාලම් වැඩ පළ ළඟට එන විටම සුපුරුදු පරිදි වසන්ත විට්ටච්චි සහ මම ජනේල වලින් හිස් එළියට දමා සුපුරුදු පරිදි කෑ ගැසුවෙමු.

"අයියේ.. අයියේ.. කළුතර පාලම හැදුවෙත් අයියලද..?"

"ඔව් යකෝ අපි තමා.." පාලම් වැඩපොලෙන් ආ පිළිතුර නිම වෙන්නටත් පෙරම මඩ වතුර බාල්දි ප්‍රහාරයක් බසයට එල්ල විය. මමත් වසන්තත් මඩ කරියන් මෙන් මඩ වතුරන් නෑව් සිටියෙමු. බසය තුළ සිටි සමහර අයද මඩ වතුරෙන් නෑව් ගොස් ය. ශ්‍රියන්ත අපට හිනැහෙමින් බැණ වදියි.

මේ සැඟවි පහරදීම සංවිධානය වී ඇති ආකාරය අප දැනගත්තේ පසුව ය. අපේ නාට්‍ය බසය පාලම පසු කරන්නට පැයකට පමණ පෙර මාතර නගරයේ ධවල භීෂන පෙන්නන්ට නලු නිළියන් රැගෙන ගිය බසය මේ පාලම පසු කර තිබුණි. එහි සිටි පිරිසද සුපුරුදු පරිදිම අර කෑගැසීම කර තිබුණි.

"ආයෙත් ආවොත් මුන්ට පාඩමක් උගන්වමු" යි කතිකා කරගත් පාලම් වැඩපළේ පිරිස මඩ බාල්දි සූදානම් කරගෙන සිටියහ. අනේ අපේ අවාසනාවට ඊළඟට අවේ අප ය.


සන්නස

වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

03 8707 4604
හෝ
0402 025 516

email
ads.sannasa@gmail.com

Sannasa Online

www.sannasa.com
www.Sannasa.net



Keilor medical clinic

Bulk billing (GP clinic)

Female and Male doctors Available



- Family medicine & women Health
- Travel Vaccination
- Flu Vaccine
- Physiotherapy
- Onsite pathology services

Call us today for an appointment
No Waiting Time
03 94494655
870 Old Calder Hwy,
Keilor, Vic 3036
Open Mon – Fri 9.00AM to 6.00 PM

Dr.Kingsley Joseph
MBBS,MD,FRACGP

Dr.Ivan S.Senanayake
MBBS,FRACGP

Dr.Satya Inumala
MBBS,FRACGP

friendly staff and high end technology to treat patients.
Overseas students and visitors who has insurance to claim the whole amount back
There is no gap payment.

In addition, The principal GP, Dr.Kingsle Joseph serve our community in Following locations

1 .Alpha Medical Clinic
351 Childs Rd Mill Park
03 94044888

2 Wells Medical Clinic
176, Blair Street Broadmedows
03 93021580